# HSBC Visa Signature හි වරප්‍රසාද

## සුවිශේෂී ඔබටයි

www.hsbc.lk

## පටුන

HSBC රිවෝඩ්ස් (Rewards)

HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත සමග නම්‍යශීලීත්වය

සිත සහනය

ගෙවීමේ විකල්ප

සාමාන්‍ය ප්‍රශ්න

## සාදර පිළිගැනීම!

HSBC Visa Signature කාඩ්පත සමග වරප්‍රසාද ලත් කිහිපදෙනා අතරට එක්වන්නට තීරණය කළ ඔබ වෙත අපගේ සුභාශිංසන පිළිගන්වමු.

ලොව පුරා සංචාර, ආහාර-පාන, නවාතැන් සහ සාප්පු සවාරි ආදිය සඳහා පිරිනමන සේවාවන් හා දීමනාවලට අමතරව, ඔබේ ජීවිතය වඩාත් පහසුකරවීමට අප ලබාදෙන වටිනාකම් එකතු කළ සේවාවන් සහ සැලසුම් රැසකි. මෙම සේවා මඟපෙන්වුම ඒ පිළිබඳ වැඩි විස්තර ඔබ වෙත ගෙන එයි.

මෙතෙර සහ එතෙරට ඔබගේ එකම කාඩ්පත, HSBC Visa Signature සමග වරප්‍රසාදයන් සපිරි ජීවිතයක මිහිර අත්විඳින්න.

ඕනෑම වේලාවක අංක 4 4722 75 හරහා අප අමතන්න. ඔබට අවශ්‍ය සහය ලබාදීම අපට සතුටකි.

## HSBC ප්‍රසාද දීමනා ලකුණු (රිවෝඩ්ස්) (Rewards)

වරප්‍රසාද ලත් කිහිපදෙනෙකු පමණක් භුක්ති විඳින බොහෝ ප්‍රතිලාභ සහ දීමනා සඳහා HSBC Visa Signature කාඩ්පත් හිමියකු වන ඔබ ද හිමිකම් කියයි. වඩා හොඳ සේවාවක් ඔබ වෙත ලබාදීම පිණිස අප නිරන්තරයෙන් ම නවමු දෑ හඳුන්වා දෙමු. අපගේ Signature Rewards වැඩසටහන හරහා ඔබගේ ප්‍රසාද දීමනා ලකුණු නැවත භාවිත කළ හැකි හවුල්කාර වෙළඳ ආයතනයන් (redemption partners) රැසක් සිටියි. එබැවින් ප්‍රසාද දීමනා ලකුණු මාරු කරගැනීමේ අවස්ථාවන් බොහොමයක් ද ඔබට හිමි ය. ඔබගේ ජීවන රටාවට සරිලන අන්දමින් නිර්මාණය කර ඇති රිවෝඩ්ස් වැඩසටහන මඟින් ජීවිතයේ ඔබ විඳිය යුතු සැප-සම්පත් ඔබ වෙත ළඟා කරන අපූරු වරප්‍රදසාද රැසක් අත්විඳින්න.

## ඔබේ ප්‍රසාද දීමනා (රිවෝඩ්ස්) ලකුණු (Rewards)

ඔබ ප්‍රසාද දීමනා ලකුණු උපයා ගත් විට, අප සමග සිටින 400ක ට අධික හවුල්කාර වෙළඳ ආයතන වෙතින් එකී ප්‍රසාද දීමනා ලකුණු, ස්ටාර් ලකුණු (Star Points) බවට පත්කිරීම **එසැණින්** සිදු කළ හැකියි. එසේත් නැතිනම්, හවුල්කාර පුණ්‍ය ආයතන වෙත ප්‍රදානය කළ හැකියි.

ඔබ HSBC Visa Signature කාඩ්පත් හිමියකු බැවින්, රු.1,000/-ක් වන ඔබේ වාර්ෂික ගාස්තුව අප විසින් අත්හැර දමන බැව් ද, කිසිදු අමතර ගාස්තුවකින් තොරව, ප්‍රිවිලෙජ්ඩ් රිවෝඩ්ස් (PRIVILEGED Rewards) ඔබ වෙත පිරිනමන බැව් ද සතුටින් දන්වමු. ඔබ උපයන ප්‍රසාද දීමනා ලකුණු, නැවත භාවිත කිරීමේ විශේෂ අගයක් මත, ගුවන් සැතපුම් බවට හැරවීමට **ප්‍රිවිලෙජ්ඩ්** රිවෝඩ්ස් (PRIVILEGED Rewards) මඟින් ඔබට අවස්ථාව උදා වේ.

## ප්‍රසාද දීමනා (Rewards) උපයාගන්න

**ප්‍රසාද දීමනා ලකුණු උපයන අයුරු:** ඔබේ HSBC ක්‍රෙඩිට් කාඩ්පතින් මිළ දී ගැනීම් සඳහා ඔබ වැය කරන සෑම රු.100/-ක් සඳහා ම ඔබ ප්‍රසාද දීමනා ලකුණු 1ක් උපයනු ලබයි. එහිදී ඔබ ගුවන් සැතපුම් රිවෝඩ්ස් (Mileage Rewards) සඳහා ලියාපදිංචි වී තිබේ ද නැද්ද යන කාරණය අදාළ නොවේ.

**ඔබේ ප්‍රසාද දීමනා (Rewards) ලකුණුවල වලංගු භාවය** : 2016 නොවැම්බර් මස සිට බලපැවැත් වේ.

එක් වර්ෂයක දී උපයනු ලබන ප්‍රසාද දීමනා ලකුණු, කාඩ්පත් සංවත්සරික මාසයෙන් (කාඩ්පත් සංවත්සරික මාසය යනු කාඩ්පතට වාර්ෂික ගාස්තුව අය කෙරෙන මාසයයි) වසර 02ක ට පසුව අවලංගු වනු ඇත.

2016 නොවැම්බර් මසට පෙර උපයන ලද ප්‍රසාද දීමනා ලකුණු සඳහා වසර 03ක වලංගු කාලයක් වේ. කරුණාකර වැඩි විස්තර සඳහා ප්‍රසාද දීමනා නීතිරීති සහ කොන්දේසි බලන්න.

## ප්‍රසාද දීමනා ලකුණු නැවත ලබාගන්න (Redeem Rewards)

**ප්‍රසාද දීමනා ලකුණු නැවත ලබාගන්නා අයුරු:** පහත දක්වා ඇති නැවත ලබාගැනීමේ විකල්ප අතරින් ඕනෑම විකල්පයක් (Redemption Options) ඔබට තෝරාගත හැකිය.

**දිවයින පුරා පිහිටි, අපගේ හවුල්කාර වෙළඳ ආයතනය 400ක ට අධික සංඛ්‍යාවක් වෙතින් ඔබගේ ප්‍රසාද දීමනා ලකුණු එසැණින් භාවිත කර භාණ්ඩ හා සේවා ලබාගත හැකිය.**

ප්‍රසාද දීමනා ලකුණු ප්‍රමාණය 4,000ක් වූ ඕනෑම අවස්ථාවක දී, අපගේ හවුල්කාර වෙළඳ ආයතනය 400 වෙතින් ප්‍රසාද දීමනා ලකුණු 03ක ට රු.1/-ක් වශයෙන් ඔබට හැරවිය හැකි වේ. ඔබ කළ යුත්තේ සඳහන් කර ඇති (පිටු අංක 8, 9, සහ 10 බලන්න) වෙළඳ ආයතනයක් වෙත ගොස් ඔබේ කාඩ්පත එහිදී භාවිත කිරීම පමණි.

**දිවයින පුරා පිහිටි, 1,000ක ට අධික ස්ටාර් පොයින්ට්ස් හවුල්කාර වෙළඳ ආයතනයන් හි දී ස්ටාර් පොයින්ට්ස් බවට හරවා ගන්න.**

ඔබේ ප්‍රසාද දීමනා ලකුණු සංඛ්‍යාව 4,000ක් වන ඕනෑම අවස්ථාවක දී 011 4 4722 75 හරහා අප ඇමතීමෙන් ප්‍රසාද දීමනා ලකුණු 3ක් ස්ටාර් පොයින්ට්ස් 1ක් බවට හැරවිය හැකිය.

**අංක 011 4 4722 75 හරහා අප අමතා, ඕනෑම රිවෝඩ්ස් පුණ්‍යායතනයක් (Rewards Charities) වෙත පරිත්‍යාගයක් කරන්න.**

ඔබේ ප්‍රසාද දීමනා ලකුණු සංඛ්‍යාව 4,000ක් වන ඕනෑම අවස්ථාවක දී, 011 4 4722 75 හරහා අප ඇමතීමෙන් ප්‍රසාද දීමනා ලකුණු 3ක් ස්ටාර් පොයින්ට්ස් 1ක් වශයෙන් පරිත්‍යාග කළ හැකිය.

**ප්‍රිවිලෙජ්ඩ් රිවෝඩ්ස් (PRIVILEGED Rewards)** : කිසිදු අමතර පිරිවැයකින් තොරව මයිලේජ් ප්‍රතිලාභ ඇතුළු විශේෂ ප්‍රතිලාභ රැසක් HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සැමට භුක්ති විඳිය හැකිය.

**ගුවන් සැතපුම් ප්‍රතිලාභ (Mileage Benefits)** : ගුවන් සැතපුම් බවට හරවා අපගේ නිරන්තර චාරිකා වැඩසටහන (Frequent Flyer Programme) ට අයත් හවුල්කාර ගුවන් සමාගම් සමඟ නොමිලේ ගුවන් ගමනක යෙදෙන්න.

ඔබේ Frequent Flyer සාමාජික අංකය අප සමඟ ලියාපදිංචි කර නොමිලේ ගුවන් ගමන්, ශ්‍රේණි ඉහළ දැමීම් ඇතුළු තවත් බොහෝ දෑ තෝරාගත් ගුවන් සමාගම් වෙතින් ලබාගන්න. ඔබේ ප්‍රසාද දීමනා ලකුණු සංඛ්‍යාව 5,000ක් වූ විට, ඔබේ රිවෝඩ්ස් පොයින්ට්ස්, ගුවන් සැතපුම් බවට හරහා ගත හැකිය. තෝරාගත් Frequent Flyer වැඩසටහන යටතේ රිවෝඩ්ස් පොයින්ට් එකක් ඔබ වෙත ගුවන් සැතපුම් 1ක් ලබාදේ.

## HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත සමග ඔබට හිමිවන නම්‍යශීලීත්වය

ඔබේ HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත සමඟ නම්‍යශීලී වීමේ හැකියාව ඔබට ලැබේ. ඔබගේ සාමාන්‍ය මිළ දී ගැනීම්වලට අමතරව, කාඩ්පත සඳහා පිරිනැමෙන දීමනා රාශිය සඳහා ද ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත භාවිත කර ඔබට ලබා දී ඇති ණය සීමාවෙන් උපරිම ඵල ලබාගන්න. එමඟින් ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත් වැය කිරීම් ශක්තිමත් කරගැනීමට ද ඔබට හැකියාව ලැබේ.

## කාඩ්පත් ශේෂය හැරවීමේ සැලසුම (Card Balance Conversion Plan)

අනෙකුත් බැංකුවල ඇති ඔබගේ ශේෂයන් ඔබගේ HSBC ක්‍රෙඩිට් කාඩ්පත වෙත හැරවීම මඟින් ඔබට වැඩි ඉතිරියක් භුක්ති විඳිය හැකි වේ. ඔබේ ණය සීමාවෙන් ඔබට භාවිත කළ සීමාවට යටත් ව, අවම වශයෙන් රු.25,000/-ක් සහ උපරිම වශයෙන් 80%ක් දක්වා එහිදී ඔබට හැරවිය හැකි වේ.

එසේම, හරවන ලද ශේෂය පියවීමේ විකල්ප දෙකක් ද ඔබ වෙත ලැබේ. මාස 3ක් සඳහා 0%ක පොළිය හෝ මාස 06ක් සඳහා 1%ක පොළිය අතරින් ඔබ කැමති විකල්පය තෝරාගත හැකි ය.

උදා - රු.100,000/ක ශේෂය හැරවීමේ වැඩසටහනක් මාස 03 සහ 06 සඳහා

| කාලසීමාව | හිඟ මුදල වෙනත් බැංකුවල ක්‍රෙඩිට් කාඩ්පත් වෙතින් | තෝරාගත් කාලසීමාව සඳහා වෙනත් බැංකු පොලිය වාර්ෂිකව 28% | HSBC හි පොලිය | එක් වරක් හැසිරවීමේ ගාස්තුව මාස 03 - 3.5% මාස 06 - 5.75% | ඉතිරිකිරීම |
|---|---|---|---|---|---|
| මාස 3 | රු. 100,000/- | රු. 7,000/- | 0% | රු.0/- | රු.7,000/- |
| මාස 6 | රු. 100,000/- | රු. 14,000/- | 1% - රු.6,000/- | රු.0/- | රු.8,000/- |

සටහන : ඉහත දක්වා ඇත්තේ තාවකාලික ගණනය කිරීමක් වන අතර, ගෙවීම්/දින ගණන සම්බන්ධයෙන් ඔබගේ අනෙක් බැංකුව විසින් භාවිත කරනු ලබන ගණනය කිරීමේ ක්‍රමවේදය මත එය වෙනස්විය හැකිය.

අගයයන් වෙනස්වීම් වලට විෂය වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඔබ වෙනුවෙන් ම කැප වූ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංක 4 4722 75 හරහා අප අමතන්න.

## මුදල් වාරික සැලසුම (Cash Installment Plan)

දිවි මග පෙරට ගමන් කරන විට ඔබට ළඟා විය යුතු ඉලක්කයන් ද බොහෝ වේ. නිවැරදි මූල්‍ය සහය ලබාගත හැකිවීම මඟින් එකී ඉලක්කයන් වෙත ළඟාවීම පහසුකරයි. HSBC හි මුදල් වාරික සැලසුම ඔබේ ඉලක්කයන් හා ජීවන රටාවට අයත් කටයුතු කල් නොහැර ඉටු කරගැනීමට දැන් ඔබට අවස්ථාව ඇත.

ඔබේ HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත සඳහා පිරිනමන මුදල් වාරික සැලසුමක් මඟින් ඉතා සාධාරණ ගාස්තුවක් යටතේ, ඔබේ ණය සීමාවෙන් 60%ක උපරිමයක් දක්වා මුදලක් ඔබට ඉතා ඉක්මනින් ලබාගත හැකි ය. වෙනත් කිසිදු ගිණුමක් අවශ්‍ය නැත.

වැඩි විස්තර සඳහා කරුණාකර ඔබ වෙනුවෙන් ම කැප වූ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංක 4 4722 75 හරහා අප අමතන්න.

## මුදල් වාරික සැලසුම (Card Installment Plan)

ඔබට යමක් මිළ දී ගැනීමේ අවශ්‍යතාවය දැනුනත්, ඊට අදාළ මුළු මුදල ම ගෙවා ගත නොහැකි වූ අවස්ථා කෙතරම් ද?

සමහර විට ඔබ ණය මුදලක් ලබාගන්නට සිතුවත් ඉහළ පොළී අනුපාතිකයන් නිසා ඒ අදහස ද වෙනස් කරගත්තා නේද?

ඔබේ HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් දැන් ඔබට කිසිදු පැකිලීමකින් තොරව, තෝරාගත් වෙළඳ ආයතනයන් වෙතින් ඔබ කැමති දෑ මිළ දී ගෙන, සමාන වාරිකවලින් එම මුදල ආපසු ගෙවීමේ හැකියාව ඇත.

සහභාගිවන වෙළඳ ආයතන ලැයිස්තුව සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය www.hsbc.lk වෙත පිවිසෙන්න.

## HSBC හි ශේෂය හැරවීමේ සැලසුම (Balance Conversion Plan)

HSBC හි අප, නිරන්තරයෙන් ම, නව සැලසුම් හා සේවාවන් ඔබ වෙත පිරිනමන්නේ ඔබේ සිහින හා අපේක්ෂාවන් සැබෑ කරගැනීම පහසු කිරීම උදෙසාය. ඔබට ම ගැලපෙන ආපසු ගෙවීමේ සැලසුමක් වන ශේෂය හැරවීමේ සැලසුම ඔබ වෙත පිරිනමා ඇත්තේ ද එබැවිනි. පූර්ණ සතුට භුක්ති විඳින අතර, ඔබේ වියදම්, වාරික වලින් ආපසු ගෙවීමට එමඟින් ඔබට අවස්ථාව ලබාදේ.

ඔබ පුලා පුලා බලා සිටි විදේශ සාප්පු සවාරිය, නැතිනම්, ඔබ සැලසුම් කළ ඔබේ උසස් අධ්‍යාපන සඳහා ඔබ දැරිය යුතු වියදම, එසේත් නැතිනම් අනපේක්ෂිතව ඔබට මුහුණ පෑමට සිදු වන වෛද්‍ය වියදම ගැන තවත් ලතවිය යුතු නොවේ. HSBC හි ශේෂය හැරවීමේ සැලසුම තවදුරටත් ඔබට ඒ ගැන ලතවන්නට ඉඩක් තබා නැත. අවශ්‍ය කාරණය වෙනුවෙන් වියදම් කර, ඉතා සුළු හැසිරවීමේ ගාස්තුවක් මත සමාන වාරික වලින් ආපසු ගෙවන්න.

වැඩි විස්තර සඳහා කරුණාකර ඔබ වෙනුවෙන් ම කැප වූ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංක 4 4722 75 හරහා අප අමතන්න.

## සිත සහනය

HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත යනු ආරක්ෂාව අතින් බෙහෙවින් ම සුරක්ෂිත ක්‍රෙඩිට් කාඩ්පතකි. CHIP තාක්ෂණය, දැඩි ආරක්ෂණ අංගයන්, ජාත්‍යන්තර චාරිකා රක්ෂණ සහ හදිසි අවස්ථාවන් සඳහා සහය සේවාවන්ගෙන් සමන්විත HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත සැමවිට ම, සෑම අතින් ම ඔබට සිත සහනය උදා කර දේ.

## ගෙවීමේ ක්‍රමවේද

විශාල පරාසයක සේවාවන් සපයනු ලබන තෙවන පාර්ශ්වයේ ගෙවීම් ස්ථාන 1,400 ක ට අධික සංඛ්‍යාවක් දක්වා අපගේ බෙදාහැරීමේ මාර්ගගතයන් අප විසින් පුළුල් කර ඇත්තේ, ගෙවීම් කටයුතු සඳහා මින් පෙර නොවූ විරූ පහසුකම් ඔබ වෙත සැපයීම ඉලක්ක කරගෙන ය.

## ගෙවීම් කළ හැකි ස්ථාන

දිවයිනේ ඕනෑම තැනක සිට ගෙවීම් කටයුතු සිදුකිරීමේ පහසුව ඔබට ලබාදෙනු පිණිස ගෙවීම් එකතු කිරීමේ ස්ථාන 1,400ක ට අධික සංඛ්‍යාවක් අප සතු ව ඇත.

**ගෙවීම් ස්ථාන :**

ආර්පිකෝ ප්‍රදර්ශනාගාර, කාගිල්ස් ෆුඩ් සිටි වෙළඳ ආයතන, කීල්ස් සුපර් වෙළඳ ආයතන, සිංගර් ප්‍රදර්ශනාගාර, අබාන්ස් ප්‍රදර්ශනාගාර හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඕනෑම ශාඛාවක්.

ගනුදෙනුවේ වටිනාකමින් 0.75%ක සුළු ගාස්තුවක් අය කෙරෙනු ඇත.

සියලුම HSBC ශාඛාවන් හි Easy Pay යන්ත්‍ර, දිවා-රාත්‍රී බැංකුකරණ මධ්‍යස්ථාන භාවිතය හෝ පුද්ගලික අන්තර්ජාල බැංකුකරණ, දුරකථනබැංකුකරණ, ATM හුවමාරු, HSBC බැංකු ගිණුමකින් මුදල් මාරුකිරීමක් හෝ චෙක්පතක් තැපැල් කිරීම ද සිදු කළ හැකි ය. වැඩි විස්තර සඳහා කරුණාකර www.hsbc.lk වෙත පිවිසෙන්න.

## HSBC Visa Signature පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය : 4 4722 75

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, අංක 24 | සීඝ්‍ර බැංකුකරණ මධ්‍යස්ථාන | MAS ඉන්ටිමේට්ස් පරිශ්‍රය, රත්මලාන, කඳවල වත්ත, බොරුපන පාර, 7වන පටුමග |
| ශාඛා | | | ඔරායන් සිටි පරිශ්‍රය - කොළඹ 09, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 752 |
| බම්බලපිටිය | කොළඹ 04, බෞද්ධාලෝක මාවත, අංක 123 | | කොහුවල, දුටුගැමුණු වීදිය, අංක 135 |
| වැල්ලවත්ත | කොළඹ 06, ගාලු පාර, අංක 38 | | |
| | කොළඹ 06, ගාලු පාර, අංක 38 | | ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 3 වන මහල |
| | | | කොළඹ 02, නවම් මාවත, ෆෝබ්ස් ඇන්ඩ් වෝර්කර්ස් ගොඩනැගිල්ල, අංක 46/38 |
| නුගේගොඩ | නුගේගොඩ, නාවල පාර, අංක 171 | පිටත පිහිටි ATMs | ලිබර්ටි ප්ලාසා (ප්‍රේමසිරි සුපිරි වෙළඳසැල ඉදිරියෙන්)<br>ගල්කිස්ස (ලංකා බෙල් අසල)<br>රාජගිරිය (මැක්ඩොනල්ඩ්) පරිශ්‍රය<br>කොළඹ 07, වෝඩ් පෙදෙස<br>(වෝඩ් පෙදෙස/කින්සි පාර සංදා එළි ආසන්නයේ) |
| මහනුවර | මහනුවර, හරස් වීදිය, අංක 27 | | |
| | | | |
| පැලවත්ත | බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, අංක 418 | | |
| කුරුඳුවත්ත | කොළඹ 07, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, අංක 41 | | |
| යුනියන් පෙදෙස | කොළඹ 02, යුනියන් පෙදෙස, අංක 163 | | |
| වත්තල | වත්තල, මීගමු පාර, අංක 149 | | |
| මීගමුව | මීගමුව, කොළඹ පාර, අංක 150 | | |
| මොරටුව | මොරටුව, ගාලු පාර, අංක 198 | | |
| ගාල්ල | ගාල්ල, පෙට්ටිගලවත්ත, මාතර පාර, අංක 120/2 | | |
| යාපනය | යාපනය, කන්කසන්තුරේ පාර, අංක 145 | | |

## සාමාන්‍ය ප්‍රශ්න

ප්‍රඃ **ක්‍රෙඩිට් කාඩ්පත සඳහා වන වාර්ෂික සහ සම්බන්ධවීමේ ගාස්තු මොනවා ද?**

පිඃ

| ගාස්තු | මූලික කාඩ්පත | අතිරේක කාඩ්පත |
|---|---|---|
| වාර්ෂික | රු.7,000/- | රු.2,500/- |
| සම්බන්ධවීමේ | රු.2,500/- | රු.1,500/- |

ප්‍රඃ **මා හට හිමිවන පොළී රහිත ණය කාලසීමාව කොපමණද?**

පිඃ දින 51ක් දක්වා කාලයක් සඳහා පොළී රහිත ණය ඔබට හිමි වනු ඇත.

ප්‍රඃ **මාගේ ක්‍රෙඩිට් කාඩ්පත මත වන ගෙවිය යුතු මුදල සඳහා මා විසින් ගෙවිය යුතු පොළිය/මූල්‍ය ගාස්තුව කොපමණ ද?**

පිඃ මූල්‍ය ගාස්තු - සියලු මිළ දී ගැනීම් සහ මුදල් අත්තිකාරම් ඇතුළු ගනුදෙනු - මාසිකව 2.33% (වාර්ෂිකව 28%). ගෙවීමට නියමිත දිනයක දී සම්පූර්ණ ගෙවීම අප විසින් නොලද අවස්ථාවක දී හෝ ගෙවීමට නියමිත දින හෝ එදිනට පෙර, හෝ එදිනට පසු කොටසක් ගෙවීම/අවම ගෙවීම සිදු කළ අවස්ථාවක දී හෝ ගෙවීමට නියමිත දිනයෙන් පසු සම්පූර්ණ ගෙවීම සිදු කළ අවස්ථාවක දී පොළිය අය කෙරෙනු ඇත.

ප්‍රඃ **මාගේ අවම ගෙවීමේ මුදල කොපමණක් වේද?**

පිඃ ගෙවීමට නියමිත මුදලින් 4%ක් හෝ රු.500/-ක් අතරින් වැඩි අගය.

සීමාව ඉක්මවා ඇති ගිණුම් සඳහා - ණය සීමාවට වඩා වැඩියෙන් භාවිත මුදල සහ ණය සීමාවෙන් 4%. මුදල් වාරික සැලසුම් හෝ කාඩ්පත් ශේෂය හැරවීමේ සැලසුම් සහිත ගිණුම් සඳහා - සැලසුමෙහි මාසික වාරිකය සහ ගෙවීමට නියමිත ශේෂයෙන් 4%.

ප්‍රඃ **ගෙවීම ප්‍රමාද වුවහොත්, ප්‍රමාද ගාස්තුව කොපමණ ද?**

පිඃ ප්‍රමාද ගාස්තුව වශයෙන් රු.990/-ක් අදාළ වනු ඇත.

ප්‍රඃ **මා වෙත ලබා දී ඇති ණය සීමාවට වඩා වැඩියෙන් මාගේ ක්‍රෙඩිට් කාඩ්පත භාවිත කළහොත් අය කෙරෙන මුදල කොපමණ ද?**

පිඃ ණය සීමාව ඉක්මවීමේ ගාස්තුව වශයෙන් රු.900/-ක් අදාළ වනු ඇත.

ප්‍රඃ **ඔබගේ සේවා මට්ටමේ කැපවීම කුමක් ද?**

පිඃ ඔබේ ගැටලුව ඉක්මනින් විසඳීමට අපට නොහැකි නම්, ඔබගේ පසුවිපරම ලැබීමේ දින සිට වැඩකරන දින තුනක් ඇතුළත අප විසින් ඔබ වෙත විසඳුමක් ලබා දෙන්නෙමු. එසේ වුවද, ඇතැම් ගැටලු ඉතා සංකීර්ණ විය හැකි අතර, විසඳීම සඳහා තරමක වැඩි කාලයක් ගත විය හැකි ය. එවැනි අවස්ථාවක දී, ප්‍රතිචාර දැක්වීමේ කාලයක් පිළිබඳව අප විසින් ඔබ වෙත දන්වා සිටින්නෙමු.

ප්‍රඃ **නියමිත වේලාවට ගෙවීම් සිදුකිරීමේ වැදගත්කම කුමක් ද?**

පිඃ ඔබගේ ණය සීමාව අප විසින් කලින් කලට සමාලෝචනය කරනු ලබන අතර, අවශ්‍ය නම්, ඔබේ ණය සීමාව ඉහළ නැංවීම සිදු කරයි. ඔබේ කාඩ්පත නිරන්තරයෙන් භාවිත කිරීම සහ නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීම එකී ස්වයංක්‍රීය ඉහළ නැංවීම් සඳහා ඔබ ලබන සුදුසුකම් වනු ඇත. කාඩ්පත හා පවතින ණය සීමාව නිතර භාවිත නොකිරීම, සහ ප්‍රමාද වී සිදු කරන ගෙවීම් ඔබේ ණය සීමාව ස්වයංක්‍රීයව පහළ දැමීමට හේතු විය හැකි ය. ඔබගේ ප්‍රකාශනය හරහා විශේෂ පණිවුඩ වශයෙන් එකී කරුණු ඔබ වෙත දැනුම් දෙනු ඇත.

නියමිත දිනයේ දී අවම මුදල නොගෙවන අවස්ථාවක දී ඔබේ ගිණුම 'ගෙවීම් පැහැර හරින ලද' යනුවෙන් කාණ්ඩගත කෙරෙන බව ද කරුණාවෙන් සලකන්න. ප්‍රමාද වී ගෙවීම් සහ දී ඇති ණය සීමාවට වැඩියෙන් ඔබේ ගිණුම භාවිත කිරීම් හේතුවෙන් ගනුදෙනු ප්‍රතික්ෂෙපවීම ද සිදු විය හැකිය. එහිදී, ඔබ පිළිබඳ ණය ප්‍රමාණනය කිරීම්වල දී ඉන් අහිතකර බලපෑම් ඇතිවිය හැකි අතර, ණය සීමාව ඉහළ දමන ලෙසට ඔබ විසින් ඉදිරියේ දී සිදු කරනු ඇති ඉල්ලීම් ප්‍රතික්ෂෙපවීම ද සිදුවිය හැකිය. රෙගුලාසිවලට අනුව ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත් තොරතුරු විධිමත් පදනමක් මත ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කරනු ලබයි.

ප්‍රඃ **කාඩ්පත ලද විගස මා විසින් අනුගමනය කළ යුතු වැදගත් පියවර මොනවා ද?**

පිඃ කරුණාකර ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත ඔබ වෙත ලැබුණු වහා ම එහි පිටුපස සපයා දී ඇති තීරුවෙහි ඔබගේ අත්සන තබන්න. කරුණාකර ඔබගේ කාඩ්පත භාවිතා කිරීමට පෙර එය සක්‍රීය කිරීමට මතක තබාගන්න. ඔබගේ කාඩ්පත වෙනුවට වෙනත් කාඩ්පතක් ලබාදී ඇත්නම් හෝ අළුත් කර ඇත්නම්, ඔබගේ පැරණි කාඩ්පත කැබලි හතරකට කපා දැමීමෙන් එය විනාශකර දමන්න. ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත වෙනත් කිසිවෙකුට භාවිතා කිරීමට අවසර නොදෙන්න.

ප්‍රශ්නය:	**මාගේ කාඩ්පත් තොරතුරු තෙවන පාර්ශ්වයක් හා බෙදා-හදා නොගැනීම කෙතරම් වැදගත් ද?**

පිළිතුර:	ඔබගේ කාඩ්පත් විස්තර භාවිතා කිරීම මගින්, ගනුදෙනු සඳහා ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පතෙන් අයකිරීමට ඉඩ ඇත. (මෙයට භෞතික කාඩ්පත හෝ අත්සනක් අවශ්‍ය නොවේ). එබැවින්, කරුණාකර ඔබගේ කාඩ්පත් විස්තර වෙනත් කිසිවෙකු වෙත ලබාදීමෙන් වැලකී සිටින්න.

ප්‍රශ්නය:	**මාගේ පුද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) භාවිත කිරීමේ දී මා විසින් මතක තබාගත යුත්තේ මොනවා ද?**

පිළිතුර:	ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත හා PIN අංකය කිසිවිටෙකත් එකට තබා නොගන්න. (ඔබගේ PIN අංකය මතක තබාගෙන PIN දැන්වීම්පත විනාශකර දමන්න). ඔබ, ඔබගේ PIN අංකය වෙනස් කරන්නේ නම් දුරකථන අංක, හැඳුනුම්පත් අංක හෝ උපන් දිනය වැනි ප්‍රකට අංක භාවිතා නොකරන්න.

ප්‍රශ්නය:	**මාගේ අන්තර්ජාල බැංකුකරණය ආරක්ෂා කරගත හැක්කේ කෙසේ ද?**

පිළිතුර:	අන්තර්ජාලය භාවිත කිරීමේ දී ඔබේ ආරක්ෂාව උදෙසා ගත හැකි පියවර බොහෝය. ආරක්ෂාකාරී ලෙස අන්තර්ජාලය භාවිත කිරීම සම්බන්ධ උපදෙස් සඳහා කරුණාකර www.hsbc.lk වෙත පිවිසෙන්න.

ප්‍රශ්නය:	**මාගේ ක්‍රෙඩිට් කාඩ්පත නැති වුවහොත් හෝ සොරකම් කරනු ලැබුවහොත් මා විසින් කළ යුත්තේ කුමක් ද?**

පිළිතුර:	ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත නැති වුවහොත්, හැකි ඉක්මනින් බැංකුව වෙත ඒ බව වාර්තා කරන්න.

නැති වූ හෝ සොරකම් කළ කාඩ්පත් සම්බන්ධයෙන් වාර්තා කිරීමට

- අපගේ පාරිභෝගික සේවා අංකය වන 11 4 4722 75 අමතන්න
  ස්වයංක්‍රීය දුරකථන බැංකුකරණය සඳහා - අංක 1 ඔබන්න
  සිංහල භාෂාව සඳහා - අංක 2 ඔබන්න
  කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම පිළිබඳව වාර්තා කිරීමට - අංක 2 ඔබන්න

ප්‍රශ්නය:	**ආරවුල් විසඳීම පිළිබඳව ඇති උපදෙස් මොනවා ද?**

**පිළිතුර:**	අවිධිමත් ඇතුළත් කිරීම් ඇද්ද යන්න පිළිබඳව විමසා බැලීම සඳහා ඔබගේ ප්‍රකාශනය පරීක්ෂාකර බලන්න. කරුණාකර ප්‍රකාශනයේ සඳහන් ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගනුදෙනු පිළිබඳව පරීක්ෂා කරනු ලබන බවට සහතික වී, යම් නුහුරු ගනුදෙනුවක් එහි සඳහන් වේ

නම්, ඔබගේ ප්‍රකාශනය ලැබුණු දින සිට දින 20ක් ඇතුළත ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.

**ප්‍රශ්නය:** **අවිධිමත් සඳහන් කිරීම් ඇත්නම් කළ යුත්තේ කුමක් ද?**

**පිළිතුර:** ඔබ විසින් වහාම 0114 4722 42 දරන දුරකථන අංකය ඔස්සේ අප ඇමතීම මගින් හෝ අපගේ විද්‍යුත් තැපැල් ලිපිනය වන creditards@hsbc.com.lk වෙත විද්‍යුත් තැපැල් පණිවුඩයක් යැවීම මගින් හෝ තැපැල් පෙට්ටිය 73, කොළඹ යන ලිපිනය වෙත ලිඛිතව දැනුම්දීම මගින් හෝ එම ආරවුල් සහිත ගනුදෙනුව පිළිබඳව දැනුම්දිය හැකි ය.

ප්‍රශ්නය: **ගනුදෙනුකරුවකු වෙතින් ආරවුලක් පිළිබඳව කරුණු ලද අවස්ථාවක දී බැංකුව විසින් කුමක් කරයි ද?**

**පිළිතුර:** ආරවුලේ ස්වභාවය පිළිබඳව සහ VISA රෙගුලාසි මත පදනම් ව බැංකුව විසින් යම් නිශ්චිත කාලසීමාවක් ඇතුළත ආරවුල විසඳීම සඳහා සියලු උත්සාහයන් දරනු ලැබේ.

ප්‍රශ්නය: **ආරවුල විසඳීමේ ප්‍රගතිය පිළිබඳව මා යාවත්කාලීන කිරීමට බැංකුව විසින් කෙතරම් කාලයක් ගනු ඇති ද සහ එකී කාලසීමාව තුළ දී මා හට කාඩ්පත භාවිත කිරීමේ හැකියාව තිබේ ද?**

පිළිතුර: ගනුදෙනුකරුගේ ආරවුල පිළිබඳ විස්තර ලැබීමෙන් පසුව වැඩ කරන දින 02ක් ඇතුළත එම ආරවුලේ තත්ත්වය බැංකුව විසින් ගනුදෙනුකරු වෙත දැනුම් දෙනු ලැබේ. උචිත අවස්ථාවල දී සහ අවශ්‍ය වන විට තවදුරටත් වූ දැනුම්දීම් සිදුකරනු ලැබේ. බැංකුව විසින් අන්‍යාකාරයකින් නිශ්චිතව දක්වනු ලැබුවහොත් මිස, ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය සිදුවන කාලය තුළ දී, ගනුදෙනුකරු විසින් ක්‍රෙඩිට් කාඩ්පත භාවිත කරනු ලැබිය හැකි ය.

**ප්‍රශ්නය:** **ක්‍රෙඩිට් කාඩ්පත සම්බන්ධයෙන් ගෙවීම් නියමිත දිනය හා බිල්ගත කිරීමේ චක්‍රය වෙනස් කළ හැකි ද?**

පිළිතුර: ඔව්. ඒ සඳහා ඔබ කළ යුත්තේ පැය 24 පුරා වන අපගේ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය අමතා ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කිරීම පමණි.

ප්‍රශ්නය: **ඔබගේ පාරිභෝගික සේවාව සම්බන්ධයෙන් මා තෘප්තිමත් නොවේ නම්, මාගේ ගැටළුව ඉදිරිපත් කරන්නේ කෙසේ ද?**

පිළිතුර: අපගේ (ශාඛවන් හි සහ ඇමතුම් මධ්‍යස්ථානවල සිටින) පාරිභෝගික සේවා කාර්ය මණ්ඩලය මිත්‍රශීලී සහ වෘත්තීමය කාර්ය මණ්ඩලය ඔබේ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සැදී-පැහැදී සිටියි. ඔබ සෑහීමට පත්වන ආකාරයෙන් ගැටලු විසඳීමට ඔවුන් සියලු උත්සාහයන් දරනු ඇත.

කෙසේ වෙතත් ඔබ වෙත සේවාවන් සැපයෙන ආකාරය සම්බන්ධයෙන් ඔබ පූර්ණ වශයෙන් සතුටට පත් නොවේ නම්, හෝ අපගේ සැලසුම් මගින් ඔබගේ අපේක්ෂාවන් ඉටු නොවේ නම්, කරුණාකර ඔබේ ගැටලුව පහත ලිපිනය හරහා අප වෙත යොමු කරන්න.

කළමනාකරු පාරිභෝගික අත්දැකීම් හා සබඳතා
පාරිභෝගික බැංකුකරණ සහ වත්කම් කළමනාකරණ
HSBC මධ්‍යස්ථානය
525, යුනියන් පෙදෙස
කොළඹ 02
හෝ
ඔබේ ගැටළුව පහත විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරන්නඃ
පොදු - customersolutions@hsbc.com.lk
රහස්‍ය භාවය සහ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා, පුද්ගලික අන්තර්ජාල බැංකුකරණය ඔස්සේ සුරක්ෂිත පණිවුඩයක් හරහා වුවද අප වෙත ලියන්නට ඔබට පුළුවන. වම්පස මෙනුවෙහි ඇති “Contact Centre – Send Message”මත Click කරන්න.

**අමතන්න**

ඔබ වෙනුවෙන්ම කැපවුණු පාරිභෝගික විසඳුම් ක්ෂණික ඇමතුම් අංකය: +94-11-451 1566

## අපගේ ශාඛාව වෙත පැමිණෙන්න

අපගේ ඕනෑම HSBC ශාඛාවක් වෙත ගොස් ශාඛාව භාර කළමනාකරු හමු වී කථා කිරීමේ හැකියාව ඔබට ඇත. නැතිනම්, “ඔබේ අදහස්වලට සවන්දීම” නැමති පෝරමයෙහි ඔබේ අදහස් ලියා අප වෙත ලබාදෙන්න. ඔබගේ සබඳතා කළමනාකරු හෝ අපගේ ශාඛා කාර්ය මණ්ඩලයේ අයෙකු සමඟ වුවද සෘජුව කථා කිරීමේ හැකියාව ඔබට ඇති අතර, ඔවුන් ඉතා සතුටින් ඔබට අවශ්‍ය සහය ලබාදෙනු ඇත.

## සේවා මට්ටමේ අදහස් දැක්වීම

අපට ගැටලුව ඉක්මනින් විසඳිය නොහැකි නම්, ඔබගේ පසුවිපරම ලැබීමේ දින සිට වැඩකරන දින තුනක් ඇතුළත අප විසින් ඔබ වෙත විසඳුමක් ලබා දෙන්නෙමු. එසේ වුවද, ඇතැම් ගැටලු ඉතා සංකීර්ණ විය හැකි අතර, විසඳීම සඳහා තරමක වැඩි කාලයක් ගත විය හැකි ය. එවැනි අවස්ථාවක දී, ප්‍රතිචාර දැක්වීමේ කාලයක් පිළිබඳව අප විසින් ඔබ වෙත දන්වා සිටින්නෙමු.

## මූල්‍ය ඔම්බුඩ්ස්මාන්වරයාගේ කාර්යාලය - ශ්‍රී ලංකාව

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය.

2002 අප්‍රේල් මස ආරම්භ කරන ලද මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ පැකේජයේ කොටසක් ලෙස පිහිටුවන ලද මූල්‍ය ඔම්බුඩ්ස්මාන් කාර්යාලය ස්වාධීන, අපක්ෂපාතී සහ නොමිලයේ ලබාදෙන සේවාවකි.

ඔම්බුඩ්ස්මන් වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ.

ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය
143ඒ, වජිර පාර, කොළඹ 5.
දුරකථන- 94 112 595 624
ෆැක්ස්- 94 112 595 625
විද්‍යුත් තැපැල- fosril@financialombudsman.lk
වෙබ් අඩවිය- www.financialombudsman.lk

මෙම ලේඛනයේ ඉංග්‍රිසි හෝ දමිළ භාෂා පරිවර්තනයේ පිටපත් ඔබට අවශ්‍ය නම්, කරුණාකර අපගේ වෙබ් අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න, නැතිනම් අපගේ ඕනෑම ශාඛාවකින් ඉල්ලා සිටින්න.

**CDP/VPC/WL/SIN/ V – 2017.2**